# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1613 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 23/12/2023 පැය 1140

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම සම්බන්ධ වාර්තාව.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට 2023.12.23 වන දින දක්වා විශේෂ මෙහෙයුම් ආරම්භ කෙරිණි.

එයට සමගාමීව 2023.12.22 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 1694 කට අදාලව සැකකරුවන් 1615 ක් සහ සැකකාරියන් 61 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 119 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර, සැකකරුවන් 45 දෙනෙකුගේ වත්කම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීමට නියමිතය. තවද සැකකරුවන් 112 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 365 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 282 ක්, ගංජා ග්‍රෑම් 730 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 733 කදී සැකකරුවන් 695 ක් හා සැකකාරියන් 35 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීමේදී හෙරොයින් ග්‍රෑම් 76 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 ක් හා ගංජා ග්‍රෑම් 262 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 185 කදී සැකකරුවන් 180 ක් හා සැකකාරියන් 5 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත පරිදි සඳහන් කර ඇත.

| හෙරොයින් ප්‍රමාණය (g/mg) | අයිස් ප්‍රමාණය (g/mg) | ගංජා ප්‍රමාණය (g/mg) | ගංජා පැළ | වෙනත් මත් ද්‍රව්‍ය ප්‍රමාණය (g/mg) | මත්පෙති | මුළු වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | | රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිත සැකකරුවන් ගණන | වත්කම් විමර්ශන ආරම්භ කිරීමට අදාළ කරන සැකකරුවන් ගණන | පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ස්ත්‍රී | පුරුෂ | | | |
| 692.713 | 392.931 | 42092.628 | 235680 | 13185.323 | 20615 | 1694 | 61 | 1615 | 119 | 45 | 112 |

ඒ අනුව 2023.12.17 වන දින සිට 2023.12.22 වන දින දක්වා සිදු කරන ලද සමස්ත වැටලීම් වලට අදාලව හෙරොයින් කිලෝග්‍රෑම් 8 ග්‍රෑම් 478 ක්, අයිස් කිලෝග්‍රෑම් 4 ග්‍රෑම් 300 ක්, ගංජා කිලෝග්‍රෑම් 269 කට ආසන්න ප්‍රමාණයක් ද ගංජා පැළ 235680 ක්, වෙනත් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 163 ක් හා මත්පෙති 64882 ක් ද වශයෙන් අත්අඩංගුවට ගෙන ඇත.

සමස්ත වැටලීම් 12247 ක් සිදු කර සැකකාරියන් 469 ක් හා සැකකරුවන් 11663 ක් ලෙස මුළු සැකකරුවන් 12132 ක් අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුවන් 636 ක් සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට කටයුතු කෙරිණි. සැකකරුවන් 151 ක් සඳහා වත්කම් විමර්ශන ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර සැකකරුවන් 998 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිතව ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**